# GRADE 10

# UNIT 6

# AREA




Sujeewa Amaratunga

NATIONAL DIPLOMA IN TEACHING (MATHS SP.)

B.ED (MATHS) MSC (EDUCATION)

# වර්ගඵලය

# AREA

## තල රූපවල වර්ගඵලය

වර්ගඵලය යටතේ ඔබ මීට පෙර උගත් විෂය කරුණු නැවත සිහිපත් කර ගනිමු.

| නම | තල රූපය | වර්ගඵලය ගණනය කරන ආකාරය | වර්ගඵලය ($A$) සඳහා සූත්‍රය |
|---|---|---|---|
| සෘජුකෝණාස්‍රය |  | දිග × පළල | $A = a \times b$ |
| සමචතුරස්‍රය |  | (පාදයක දිග)$^2$ | $A = a^2$ |
| සමාන්තරාස්‍රය |  | ආධාරකය × ලම්බ උස | $A = a \times h$ |
| ත්‍රිකෝණය |  | $\frac{1}{2}$ × ආධාරකය × ලම්බ උස | $A = \frac{1}{2} \times a \times h$ |
| ත්‍රපීසියම |  | $\frac{1}{2}$ × සමාන්තර පාද දෙකේ දිගෙහි එකතුව × ලම්බ උස | $A = \frac{1}{2}(a+b) \times h$ |
| වෘත්තය |  | π × (අරය)$^2$ | $A = \pi r^2$ |

## පුනරීක්ෂණ අභ්‍යාසය

1. පහත දී ඇති එක් එක් තල රූපයේ වර්ගඵලය සොයන්න.




2. පහත දී ඇති $A$ හා $B$ රූපවලින් දැක්වෙන ත්‍රපීසියම හා ත්‍රිකෝණය එක් වීමෙන් $C$ රූපයේ දැක්වෙන සෘජුකෝණාස්‍රය සෑදී ඇත.




(i) $A$ රූපයේ දැක්වෙන ත්‍රපීසියමේ වර්ගඵලය සොයන්න.

(ii) $B$ රූපයේ දැක්වෙන ත්‍රිකෝණයේ වර්ගඵලය සොයන්න.

(iii) $C$ රූපයේ දැක්වෙන සෘජුකෝණාස්‍රයේ වර්ගඵලය $A$ හා $B$ රූපවල වර්ගඵල ඇසුරෙන් සොයන්න.

3. රූපයේ දක්වා ඇත්තේ ත්‍රිකෝණ දෙකක් එක් වීමෙන් සෑදුණ වර්ගඵලය 33 $cm^2$ වූ ත්‍රපීසියමකි. එහි අඳුරු කර ඇති ත්‍රිකෝණයේ වර්ගඵලය සොයන්න.




4. රූපයේ දැක්වෙන්නේ වර්ගඵලය 120 $cm^2$ වූ සමාන්තරාස්‍රයකි. එහි පරිමිතිය 64 cm වේ. දී ඇති තොරතුරු ඇසුරෙන් එහි,

(i) $CD$ පාදයේ දිග

(ii) $BC$ පාදයේ දිග

සොයන්න.



# කේන්ද්‍රික ඛණ්ඩයක වර්ගඵලය




සම්පූර්ණ වෘත්තයක වර්ගඵලය $\pi r^2$ බව අප දනිමු.

එවිට ඉන් $1^0$ ක කොටසක වර්ගඵලය $\frac{\pi r^2}{360^\circ}$ වේ.

එලෙසම $2^0$ ක කොටසක වර්ගඵලය $\frac{\pi r^2 \times 2^\circ}{360^\circ}$

ඒ අනුව $\theta^0$ ප්‍රමාණයක වර්ගඵලය $\pi r^2 \times \frac{\theta^\circ}{360^\circ}$ වේ.

| |
|---|
| කේන්ද්‍රික ඛණ්ඩයක වර්ගඵලය = $\pi r^2 \times \frac{\theta^\circ}{360^\circ}$ |

උදා : පහත රූපයේ වර්ගඵලය සොයන්න.




වර්ගඵලය $= \pi r^2 \times \frac{90^\circ}{360^\circ}$

$= \frac{22}{7} \times 14 \times 14 \times \frac{1}{4}$

$= \underline{\underline{154 \text{ cm}^2}}$

උදා :




සෘජුකෝණාස්‍රයේ වර්ගඵලය $= 28 \times 50$

$= 1400\ cm^2$

කේන්ද්‍රික ඛණ්ඩයේ වර්ගඵලය $= \pi r^2 \times \frac{45°}{360°}$

$= \frac{22}{7} \times 28 \times 28 \times \frac{1}{8}$

$= 308\ cm^2$

∴ මුළු වර්ගඵලය $= 1400 + 308\ cm^2$

$= \underline{\underline{1708\ cm^2}}$

උදා : රූපයේ දැක්වෙන කේන්ද්‍රික ඛණ්ඩයේ වර්ගඵලය $17\frac{1}{9}\ cm^2$ නම්  එහි අරය r සොයන්න.

$A = \pi r^2 \times \frac{40°}{360°}$




$17\frac{1}{9} = \frac{22}{7} \times r^2 \times \frac{1}{9}$

$\frac{154}{9} = \frac{22}{7} \times r^2 \times \frac{1}{9}$

$\frac{154}{9} \times \frac{9}{1} \times \frac{7}{22} = r^2$

$49 = r^2$

$\underline{\underline{7\ cm = r}}$ (එනම් අරය $7\ cm$ වේ)

රූපයේ දැක්වෙන කේන්ද්‍රික ඛණ්ඩයේ වර්ගඵලය $51\frac{1}{3}\ cm^2$ නම්, එහි කේන්ද්‍රික ඛණ්ඩයේ කෝණය සොයන්න.




$$A = \pi r^2 \times \frac{\theta^\circ}{360^\circ}$$

$$51\frac{1}{3} = \frac{22}{7} \times 7 \times 7 \times \frac{\theta^\circ}{360^\circ}$$

$$\frac{154}{3} = 154 \times \frac{\theta^\circ}{360^\circ}$$

$$\frac{154}{3} \times \frac{360^\circ}{154} = \theta$$

$$120^\circ = \theta$$

එනම් කෝණය $120^0$

සංයුක්ත රූපවල වර්ගඵලය සොයනු ලබන්නේ එක් එක් කොටසේ වර්ගඵලය වෙන වෙනම සොයා ඒවා එකතු කිරීමෙනි.

6.1 හා 6.2 අභ්‍යාස කරන්න.